(සියළුම හිමිකම් ඇවිරිණි)
(All Rights Reserved)

# පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවත්වෙන විභාගය

II පත්‍රය

## නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන

## ''අදිති''

05

කාලය - පැය 1 යි මිනිත්තු 15 යි

විභාග අංකය ......................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :-**

* ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
* තුන්වන පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 58 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
* පිළිතුරු 3ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න. පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉරි මත ලියන්න.
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

### උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදි ය. | V/I/S/CH |

01. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වයස අවුරුදු තුනේ දී හදිසි අනතුරකින් සදහට ම දෘශ්‍යාබාධිත තත්වයට පත් වූ පුංචි ලූයී ට දිනෙන් දින මුහුණපාන්නට සිදු වූ අභියෝග රැසකි. ඒ අභියෝග ජය ගනිමින් ඔහු දෙනෙතින් නොව සවනින් ලෝකය හඳුනාගත් ආකාරය මෙහි සඳහන් වේ.

(1) ඡේදයෙන් කියවෙන්නේ කවුරුන් ගැන ද ? ..........

(2) ඡේදයෙන් සඳහන් විශේෂණ පදයක් ලියන්න. ..........

(3) ගැට ඇලපිල්ල යෙදුණු වචනයක් සොයා ලියන්න. ..........

(4) මෙහි සඳහන් පුද්ගලයා දෘශ්‍යාබාධිත වන්නේ කෙසේ ද ? ..........

(5) පහත පද සඳහා යෙදී ඇති පද සොයා ලියන්න.

(i) ඇස් දෙකෙන් - .......... (ii) කනින් - ..........

$(1 \times 6 = 6)$

02. වචන ගළපා වැකි නිර්මාණය කරන්න.

(i) කලින් / ඇට / මෙහෙම / මීට / නැහැ / දෙයක් / වෙලා

..........

(ii) කිසිවෙකුගෙන් / එල්ල / ඇයගේ / බාධාවක් / රාජකාරියට / විය / නො

..........

$(1 \times 2 = 2)$

03. මෙම වැකි ලේඛන වහරට හරවා ලියන්න.

(1) අපි සරුංගලයක් යවන්නට සූදානම් වුණා.

..........

(2) නංගී වතුර බොන්න වීදුරුවක් අරගෙන කුස්සියට යනවා.

..........

$(1 \times 2 = 2)$

04. පහත යෙදුම්වල අදහස පැහැදිළි කරන්න.

(1) මුරුංගා අත්තේ තියනවා - ..........

(2) මොරසූරන වැස්ස - ..........

$(1 \times 2 = 2)$

05. ගැළපෙන ස්ථානවල විරාම ලකුණු යොදන්න.

(1) නගුල මම මීට කලින් දැකලා නැහැ රිසානා කීවා ය

(2) පියාණෙනී ඔබට සෙත්වේවා $(1 \times 2 = 2)$

06. පහත විස්තරයට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

(1) තමා අවට සමාජය ගැන කිසිවක් නොදන සිටිම.

..............................................................................................................................

(2) ස්ථිර තීරණයක් ගත නොහැකිව සිටීම.

..............................................................................................................................

$(1 \times 2 = 2)$

07. මෙම වැකි ස්ත්‍රී ලිංගයට හරවා අතීත කාලයෙන් ලියන්න.

(1) සේවකයා උද්‍යානය පිරිසිදු කරයි.

..............................................................................................................................

(02) ගුරුවරයා දක්ෂ ලෙස උගන්වයි.

..............................................................................................................................

$(1 \times 2 = 2)$

08. දී ඇති නම පහත කොටු තුළ ලියා දක්වන්න.

හෙන්දිරිප්පු හැන්නදිගේ කෞෂල්‍යා රංගනී

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |

$(1 \times 2 = 2)$

09. එක් එක් ඉංග්‍රීසි වචනයක් සඳහා යෙදෙන සිංහල වචනය බැගින් ලින්න.

(1) National Flag - ..............................................................................................


(2) Library - ..............................................................................................

$(1 \times 2 = 2)$

10. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.



..............................................



..............................................

$(1 \times 2 = 2)$

11. පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(1) book / reading / a / am / I ..............................................................................

(2) old / you / How / are ..............................................................................

$(1 \times 2 = 2)$

12. 'කදිරෛ' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න. ...............................
$(1 \times 2 = 2)$

13. පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

එන්න බත් කන්න - ...............................................................................................................
$(2 \times 1 = 2)$

✸ පහත ප්‍රශ්න සඳහා පිළිතුරු අදාළ හිස්තැනෙහි යොදන්න.

14. ''දහතුන් දහස් එකොළහ'' යන සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න. .........................................
$(2 \times 1 = 2)$

15. 53011 යන සංඛ්‍යාවේ 3 ඉලක්කමෙන් නිරූපිත අගය ලියන්න. ............................................
$(2 \times 1 = 2)$

16. පහත කොටුවල ඇති කුඩාම ඉලක්කම් භාවිතා කර සෑදිය හැකි විශාලම සංඛ්‍යාව ලියන්න.

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4 1<br>3 2 | | 5 6<br>2 0 | | 9 5<br>8 4 | | 8 7<br>6 0 | | ...................................... | | $(2 \times 1 = 2)$ |

17. පහත සංඛ්‍යා රටාවල හිස්තැන් පුරවන්න.

(1) 4 , 10 , 15 , 19 , 22 , ................

(2) 8 , 4 , 16 , 8 , 24 , 12 , 32 , ................ $(2 \times 2 = 4)$

18. පොල් ගෙඩි 28 කින් හතරෙන් පංගු තුනක ඇති පොල් ගෙඩි ගණන කිය ද? ..................
$(2 \times 1 = 2)$

19. පෙ.ව. 11.40 ට නිවසින් පිටත් වූ නයනි පැය 1 යි මිනිත්තු 45 කින් නැන්දාගේ නිවසට පැමිණියා ය. ඇය නැන්දාගේ නිවසට පැමිණි වේලාව ඩිජිටල් ඔරලෝසුවේ සටහන් කරන්න.

| |
|---|
| ................. : ...................... |

$(2 \times 1 = 2)$

20. පලතුරු වෙළඳසැළක අඹ විකුණූ ප්‍රමාණයන් මෙසේ වගු ගත කර ඇත.

| දවස | ප්‍රමාණය |
|---|---|
| සඳුදා | අඟහරුවාදා විකිණී ඇත්තේ සඳුදා විකුණා ඇති ප්‍රමාණය මෙන් දෙගුණයකි. |
| අඟහරුවාදා | 56 |
| බදාදා | සඳුදා සහ අඟහරුවාදා විකුණූ අඹ මෙන් දෙගුණයකි. |

(1) සඳුදා විකුණූ අඹ ගෙඩි ගණන කීය ද? ..........................................................................

(2) බදාදා විකුණූ අඹ ගෙඩි ගණන කීය ද? ..........................................................................


(2 × 2 = 4)

21. A නගරයේ සිට B නගරය හරහා C නගරය දක්වා ඇති මාර්ගයේ දිග 12km 075m වේ. එම මාර්ගයේ A සිට B තෙක් දිග 4km 125m කි. එසේ නම් B සිට C දක්වා දිග කොපමණ ද ? ..........................................................................

(2 × 1 = 2)

22. සුමිත් රු.500 නෝට්ටුවක් දී එකක් 12.00 ක් වන පොත් 5 ක් ද,එකක් රු. 14.00 වන පෑන් 5 ක් ද මිලට ගත්තේ නම් සුමිත්ට ලැබෙන ඉතුරු මුදල කීය ද ? ..............................

(2 × 1 = 2)

23. 


A භාජනයේ ඇති දියර ප්‍රමාණයට B භාජනයෙන් 8 වරක් ජලය වත් කළ විට අපතේ යන දියර ප්‍රමාණය කොපමණ ද ? ...............................................

(2 × 1 = 2)

24. ගැටලු විසඳන්න.

(1)

| | kg | g |
|---|---|---|
| | 4 | 50 |
| + | 5 | 50 |
| | | |

(2)

| | m | cm |
|---|---|---|
| | 10 | 75 |
| − | 2 | 125 |
| | | |

(2 × 2 = 4)


25. දී ඇති සටහන ඇසුරෙන් පිළිතුරු සපයන්න.
(නගර අතර දුර දක්වා ඇත්තේ km වලිනි)

| | | | |
|---|---|---|---|
| | | | රත්නපුර |
| | | ගාල්ල | 91 |
| | මාතර | 32 | 126 |
| තංගල්ල | 48 | 83 | 87 |

තංගල්ලේ සිට මාතරට ගොස් මාතර සිට රත්නපුරට යන අයෙකු යා යුතු මුළු දුර කොපමණ ද? ............................

(2 × 1 = 2)

26. සිසුන් කණ්ඩායමක් වඩාත්ම කැමති ක්‍රීඩා පිළිබඳ තොරතුරු ප්‍රස්තාරයේ නිරුපණය කර ඇත.




(1) නෙට්බෝල් වලට කැමති සිසුන් සංඛ්‍යාවට වඩා පාපන්දු වලට කැමති සිසුන් ගණන කීයකින් වැඩි ද? ..........................................

(2) නෙට්බෝල් ක්‍රීඩාවට කැමති ළමුන්ට වඩා දෙගුණයක් කැමති ළමුන් සිටින ක්‍රීඩාව කුමක් ද?

..........................................................................

$(1 \times 2 = 2)$

26. එක් පැණි බීම බෝතලයකින් උත්සවයට පැමිණි 4 දෙනෙකුට සංග්‍රහ කිරීමට ප්‍රමාණවත් ය. 38 දෙනෙකුට සංග්‍රහ කිරීමට පැණි බීම බෝතල් කීයක් අවශ්‍ය ද? ............................

$(2 \times 1 = 2)$

27. A නගරයේ සිට B නගරය හරහා C නගරය දක්වා ඇති මාරගයේ දිග 16km කි. එම මාර්ගයේ ම A සිට B තෙක් දිග 9km 550m නම් B සිට C දක්වා දිග කොපමණ ද?

.............................................................................................................................. $(2 \times 1 = 2)$

✱ පහත ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

28. කාලයකට පමණක් පිපෙන මල් වර්ගයකි.
(1) එරබදු (2) දාස්පෙතියා (3) වද

29. මේවා අතරින් අනාරක්ෂිත ස්ථානයක් වන්නේ,
(1) දුම්රිය මාර්ගයේ ගමන් කිරීම (2) නාය යන ස්ථානයක්
(3) රතිඤ්ඤා පත්තු කිරීම

30. භාවාගේ ගමන් විලාසය කියවෙන සත්ත්ව වන්නම වන්නේ,
(1) තුරඟා වන්නම (2) මුසලඩි වන්නම (3) ගජගා වන්නම

31. තෛපොංගල් උත්සවය සමරනු ලබන ආගමිකයන් වන්නේ,
(1) බෞද්ධ (2) ඉස්ලාම් (3) හින්දු

32. ශාකයකට ජලය උරාගනු ලබන්නේ,
(1) මුල් මගින් (2) පත්‍ර මගින් (3) අතු මගින්

33. සල් මලට ඇති පෙති ගණන වන්නේ,
(1) හතරකි (2) හයකි (3) පහකි

34. විටමින් C බහුල ආහාරයක් වන්නේ,
(1) මාළු (2) නෙල්ලි (3) කිරි

35. තමාගේ වාසස්ථානය උදවු කරගෙන තම ආහාර සපයා ගන්නා සතා වන්නේ,
(1) මදුරුවා (2) මීයා (3) මකුළුවා

36. පහත සතුන් අතරින් ගොවියාට හිතකර සතා නොවන්නේ,
(1) ඇටිකුකුලා (2) ගොළුබෙල්ලා (3) ගැඩවිලා

37. කොම්පෝස්ට් පොහොර සාදා ගැනීමට යොදාගත හැකි ද්‍රව්‍යයකි,
(1) වීදුරු කැබලි (2) කොළ රොඩු (3) පොලිතීන්

38. සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ දෙවන පියවර කුමක් ද?
(1) මානසික ලිහිල් බව (2) ශාරීරික ලිහිල් බව (3) අධිෂ්ඨානය

39. ''කුම්භාභිශෝතම්'' චාරිත්‍රය කරන්නේ,
(1) හින්දු ආගම (2) ඉස්ලාම් ආගම (3) බෞද්ධ ආගම

40. නිවසක වහලක් සෙවිලි කිරීම සඳහා යොදා නොගන්නා දෙයකි.
(1) කොහු (2) ටකරන් (3) උළු

41. වර්තමානයේ ජාතික පුෂ්පය ලෙස හඳුන්වන්නේ,
(1) සුදු නෙලුම් මල (2) මානෙල් මල (3) නා මල

42. පිටරට සිටින කෙනෙකුට ඉක්මනින් ම වේගවත්ව ඡායාරූපයක් යැවිය හැකි ක්‍රමයක් වන්නේ,
(1) සීඝ්‍රගාමී තැපැල (2) විද්‍යුත් තැපැල (3) ගුවන් තැපැල

43. පහත සඳහන් ආහාර ද්‍රව්‍ය අතුරින් නිෂ්පාදන දිනය හා කල් ඉකුත්වීමේ දිනය අතර අඩුම කාලයක් ඇත්තේ කුමකට ද?
(1) බිස්කට් (2) මුදවපු කිරි (3) ජෑම්

44. ඇඳුමක් මැසීමේදී ඉඳිකටුව අතේ ඇඟිලිවල ඇනී තුවාල වීමෙන් ආරක්ෂා වීමට භාවිතා කරන උපකරණය වන්නේ,
(1) දැති කතුර (2) එම්බොයිඩර් රාමුව (3) දිදාලය

45. රූපයේ දැක්වෙන කතුවරයා වන්නේ,



(1) කුමාරතුංග මුනිදාස මහතා
(2) පියසේන කහඳගමගේ මහතා
(3) මාර්ටින් වික්‍රමසිංහ මහතා

46. අපට අවශ්‍ය දේ ඒ තුළ රඳවා ගන්නා උපකරණයකි,
(1) පෙනේරය (2) වංගෙඩිය (3) කුල්ල

47. ශ්‍රී ලංකාවේ ඉදි කළ ප්‍රථම වැව වන්නේ,
(1) මින්නේරිය වැව (2) බසවන්කුලම වැව (3) තිසා වැව

48. ශ්‍රී ලංකාවට ආවේනික ක්ෂීරපායි සතෙකි,
(1) යක් කටුස්සා (2) බුලත් හපයා (3) හික්මීයා

49. කොරෝනා වෛරසය හඳුන්වන වෛද්‍ය විද්‍යාත්මක නම වනුයේ,
(1) කොරෝනා 19 (2) කොවිඩ් 19 (3) වෛරස් 19

50. අපට නොමිලේ ලැබෙන සේවාවක් නොවන්නේ,
(1) සෞඛ්‍ය (2) අධ්‍යාපනය (3) විදුලිය

51. ශ්‍රී ලංකාවේ සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකටම ලබා දෙන පෙළපොත් ලබා දෙන්නේ කාගේ මුදලින් ද?
(1) ජනාධිපතිගේ (2) අධ්‍යාපන ඇමතිගේ (3) ජනතාවගේ

52. කිරි බී වැඩෙන සතෙකු කෑ විට සෑදෙන රෝගයකි
(1) මැලේරියාව (2) ජලභීතිකාව (3) ඩෙංගු

53. ආරක්ෂාව සඳහා ශරීරය රෝල් කිරීමේ හැකියාව තිබෙන්නේ,
(1) බල්ලා (2) කබල්ලෑවා (3) හූනා

54. පහත වාහන අතුරින් පොදු වාහන දෙකක් වන්නේ,
(1) කෝච්චිය, බසය (2) ත්‍රීරෝද රථය, වෑන් රථය (3) කාරය, බසය

55. මනිස් ලෑල්ල භාවිතා කරන කර්මාන්තය වන්නේ,
(1) ධීවර කර්මාන්තය (2) පෙදරේරු කර්මාන්තය (3) වඩු කර්මාන්තය

56. සුළං ආධාරයෙන් ක්‍රියාකරන සංගීත භාණ්ඩයකි
(1) ගිටාරය (2) සර්පිනාව (3) වයලීනය

57. ගල් කැටයම් වලට ප්‍රසිද්ධ ඓතිහාසික ස්ථානයකි
(1) සීගිරිය (2) ඇම්බැක්කේ (3) ඉසුරුමුණිය

$(1 \times 30 = 30)$

58. ''මම සුළඟක් වෙමි'' යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වැකි 3 ක් ලියන්න. උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතුය. වැකියක වචන 5 කට නොඅඩු විය යුතුය.

(1) ..................................................................................................

..................................................................................................

(2) ..................................................................................................

..................................................................................................

(3) ..................................................................................................

..................................................................................................

$(2 \times 3 = 6)$